# දැන්වීමයි

## රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

## දේශීය ණය සහ සංවර්ධන අරමුදල

# ප්‍රධාන විධායක නිලධාරී/ අධ්‍යක්ෂ තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම

රාජ්‍ය පරිපාලන පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ පළාත් සභා සහ පළාත් පාලන අංශය යටතේ වන දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ ගණයේ ප්‍රධාන විධායක නිලධාරී / අධ්‍යක්ෂ තනතුරේ පවතින පුරප්පාඩුව (01) සම්පූර්ණ කිරීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. පත්වීමේ ස්වභාවය:**

ස්ථිර, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිත තනතුරකි.

**02. බඳවා ගැනීමේ ක්‍රමය:**

දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ කොමසාරිස් මණ්ඩලය විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතරින් ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා පුරප්පාඩු තනතුරට බඳවා ගනු ලැබේ.

මෙම සේවා ගණයට සිදු කරනු ලබන සියළු පත්කිරීම් / බඳවාගැනීම් බඳවාගැනීමේ පටිපාටියෙහි විධිවිධානයන්ට තරයේ අණුකූල වන පරිදි පමණක් සිදු කරනු ලැබේ.

**03. අවශ්‍ය සුදුසුකම්:**

**3.1 බාහිර අයදුම්කරුවන්:**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් කළමණාකරණය, වාණිජ්‍ය, ගණකාධිකරණය, ව්‍යාපාර පරිපාලනය, රාජ්‍ය පරිපාලනය හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ වෙනත් උපාධියක් ලබා තිබීම සමග අදාළ ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් ලබා තිබීම හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ, පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

සහ

උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ" තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහළොව (15) ක පළපුරුද්දක් ලබා තිබීම.

**3.2. අභ්‍යන්තර අයදුම්කරුවන්:**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම

හෝ

කළමනාකරණ සේවා (MM) සේවා ගණයෙහි 1 වන ශ්‍රේණියෙහි තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**සටහන :** "සතුටුදායක සේවා කාලය" යනුවෙන් අදහස් කරනුයේ උසස්වීම් සඳහා ඉල්ලුම් කරන දිනට පූර්වාසන්න සේවා කාලය තුල යෙදුනු සියළුම වැටුප් වර්ධක ලබා ඇත්තා වූ ද, ඒ කාලය තුල කල වරදකට (අවවාද කිරීමක් හෝ තදින් අවවාද කිරීමක් හැර) දඬුවමක් ලබා නැත්තා වූද සේවා කාලයකි.

**3.3. වෙනත් සුදුසුකම්:**

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
- අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

**04. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි:**

4.1. බාහිර අයදුම්කරුවන් අතුරින් තනතුරට පත් කරනු ලබන නිලධාරියකු වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, ඔහු /ඇය පරිවාස කාලය තුල සිය රාජකාරි වැඩ හා හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වා ගෙන ගොස් තිබේ නම් පරිවාස කාලය අවසානයේ දී සේවයේ තනතුරේ ස්ථිර කරනු ලැබේ. සුදුසුකම් ලැබීමේ සේවා ගණයේ තනතුරක ස්ථිර කර සිටින අභ්‍යන්තර අයදුම්කරුවන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් සේවයට පත් කිරීමේ දී වැඩබැලීමේ පරීක්ෂණ කාලසීමාවක් නියම කරනු ලැබේ.

4.2. බඳවා ගැනීමෙන් පසු සේවයේ යෙදවීම හා ඊට ආනුශාංගික අනෙකුත් කරුණු සම්බන්ධයෙන් ආයතනික කාර්ය පටිපාටි සංග්‍රහයේ විධිවිධාන අදාලවේ.

**05. තනතුරට පැවරෙන කාර්ය භාරය :**

ආයතනයේ කොමසාරිස් මණ්ඩලය විසින් පවරා දෙනු ලබන බලතල, කාර්යයන් හා වගකීම් එම කොමසාරිස් මණ්ඩලයේ මග පෙන්වීම හා පරිපාලනය යටතේ ඉටු කරමින් ආයතනික කාර්ය මණ්ඩලයට නායකත්වය දෙමින්ද කාර්ය මණ්ඩලය දිරිගන්වමින්ද ආයතනය ඉහළම ඵලදායීතාව කෙරෙහි යොමුකරවීමද ආයතනයෙහි සමස්ත කාර්ය සාධනය සම්බන්ධයෙන් මූලික වගකීම් හා වගවීම දැරීම ද ප්‍රධාන විධායක නිලධාරී එනම් අධ්‍යක්ෂ තනතුර දරණ අයට පැවරෙන කාර්ය භාරය වේ.

**06. වයස් සීමාව:**

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 35ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම් කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**07. වැටුප් පරිමාණය:**

මෙම පත්වීමට හිමි මාසික වැටුප් පරිමාණය (HM 1-1-2025) රු.140,640 - 4,100 X 15 - රු 202,140/- වේ.

**සටහන:** බාහිර අයදුම්කරුවන් අතුරින් බඳවාගැනීමේදී අදාල තැනැත්තා වැටුප් පරිමාණයේ ආරම්භක පියවරෙහි පිහිටුවනු ලැබේ. අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවාගැනීමේ දී පිහිටුවනු ලැබිය යුතු වැටුප් පියවර ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ විධිවිධාන පරිදි සිදු කරනු ලැබේ.

**08. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදීම:**

| අනු අංකය | විෂය | ලකුණු |
|---|---|---|
| 01 | අදාළ අතිරේක පළපුරුද්ද | 30 |
| 02 | අදාළ අතිරේක අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් | 30 |
| 03 | අනෙකුත් කාර්යය සාධනයන් හා කුසලතා | 15 |
| 04 | සම්මුඛ පරීක්ෂණයේදී කාර්ය සාධනය | 25 |
| | මුළු ලකුණු ගණන | 100 |

**09. සුදුසුකම් ලබන දිනය:**

සේවයට / තනතුරට පත් කිරීම සඳහා ඉල්ලුම් කිරීම පිණිස අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු ඉහත 3.1, 3.2 හා 3.3 වගන්තිවල සඳහන් අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසාන දින වන විට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර ඇත්නම් පමණකි.

**10. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය:**

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

සම්මුඛ පරීක්ෂණයේදී සියලුම සහතික පත්‍රවල මුල් පිටපත් හා අයදුම්කරු විසින්ම නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

සම්මුඛ පරීක්ෂණයේදී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

(I) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.

(II) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

**11. අයදුම්පත් ඉදිරිපත් කළයුතු ආකාරය:**

(I) අයදුම්පත් 2025.11.28 වැනි දිනට හෝ ඊට ප්‍රථම "ලේකම්, රාජ්‍ය පරිපාලන,පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය, පළාත් සභා සහ පළාත් පාලන අංශය, අංක 330, යූනියන් පෙදෙස, කොළඹ 02" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(II) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස්කර මුල් පිටුව අංක 01 සිට 03 දක්වාත් දෙවන පිටුව අංක 04 සිට 05 දක්වාත් සහ තුන්වන පිටුව අංක 06 සිට 08 දක්වාත් වන ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය.

(III) අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "ප්‍රධාන විධායක නිලධාරි / අධ්‍යක්ෂ තනතුරට බඳවා ගැනීම" යනුවෙන් සඳහන් කළ යුතුය.

(IV) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයකු/ සාමදාන විනිශ්චයකාරවරයකු / දිවුරුම් කොමසාරිස්වරයකු / නීතිඥවරයකු / ප්‍රසිද්ධ නොතාරිස්වරයකු / ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු හෝ පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 82,150/- ක හෝ ඊට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.

(V) දැනට රජයේ සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත්, තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය.

(VI) මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

**12. සාවද්‍ය තොරතුරු සැපයීම:**

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

**13.** පුරප්පාඩු පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ කොමසාරිස් මණ්ඩලය සතුවේ.

**14.** මෙම පුවත්පත් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් හෝ පරස්පරතාවක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

**15.** මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් හෝ මෙම බඳවා ගැනීමේ ක්‍රියාමාර්ග තුළ කිසියම් ගැටළුකාරී තත්ත්වයක් ඇති වුවහොත් ඒ පිළිබඳව පත්වීම් බලධාරියා විසින් ගනු ලබන තීරණය අවසන් තීරණය වේ.

**එස්.ආලෝකබණ්ඩාර,**
**සභාපති,**
**දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ කොමසාරිස් මණ්ඩලය.**
**2025 ඔක්තෝබර් මස 31 දින.**

කාර්යාල ප්‍රයෝජනය සඳහා

**රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය**
**දේශීය ණය සහ සංවර්ධන අරමුදල**
**ප්‍රධාන විධායක නිලධාරී / අධ්‍යක්ෂ තනතුරට බඳවා ගැනීම සඳහා වන අයදුම්පත්‍රය**

01) 1.1. මුලකුරු සමග නම : Mr./Mrs./Miss. ..................................

(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) ..................................

1.2. සම්පූර්ණ නම : ..................................

(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) ..................................

1.3. සම්පූර්ණ නම : ..................................
(සිංහලෙන්)

02) 2.1. ස්ථිර ලිපිනය : ..................................

2.2. දුරකථන අංකය :

ස්ථාවර : .................. ජංගම: ..................

03) 3.1. ජනවර්ගය : ☐

(සිංහල-1, දෙමළ-2, මුස්ලිම්-3, වෙනත්-4)

3.2. ස්ත්‍රී/පුරුෂ භාවය :

| | |
|---|---|
| ස්ත්‍රී | |
| පුරුෂ | |

3.3. විවාහක/අවිවාහක බව :

| | | | |
|---|---|---|---|
| විවාහක | | අවිවාහක | |

3.4. ජාතික හැඳුනුම්පත් අංකය:

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

3.5. උපන් දිනය :

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

3.6. 2025.11.28 දිනට වයස: අවුරුදු :....... මාස :....... දින :.......

04) 4.1. අධ්‍යාපන සුදුසුකම්:

I. උපාධිය : ..................................

II. විශ්ව විද්‍යාලය / ආයතනය: ..................................

III. උපාධිය වලංගු දිනය:..................................

4.2. පශ්චාත් උපාධි සුදුසුකම්:

I. පශ්චාත් උපාධිය : ..................................

II. විශ්වවිද්‍යාලය / ආයතනය:..................................

III. පශ්චාත් උපාධිය වලංගු දිනය :..................................

4.3. වෘත්තිය සුදුසුකම්:

I. ..................................

II. ..................................

III. ..................................

IV. ..................................

4.4. පළපුරුද්ද:

| අනු අංකය | තනතුර | කාල සීමාව | ආයතනය |
|---|---|---|---|
| 1 | | | |
| 2 | | | |
| 3 | | | |
| 4 | | | |

4.5 අභ්‍යන්තර අයදුම්කරුවන්ගේ සුදුසුකම්:

I. සේවා ගණය :..................................

II. ශ්‍රේණිය : ..................................

III. තනතුර : ..................................

IV. සතුටුදායක සේවා කාලය :

(අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ කාර්ය සාධන ඇගයුම අනුව වැඩ හැසිරීම යහපත් බව)

❖ අදළ කාර්ය සාධන වාර්තා 05හි සහතික කළ පිටපත් ඇමිණිය යුතුය.

| වර්ෂය | ඇගයුම ඉතා හොදයි / හොදයි / සතුටුදායකයි / අසතුටුදායකයි | අදාළ නිලධාරීන් අත්සන් තබා ඇත / නැත |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |

05) **යම් කිසි සාපරාධි වරදකට උසාවියේදී චෝදනා ලබා තිබේද? එසේනම් දිනය හා නඩු අංකය සමග සම්පූර්ණ විස්තර සපයන්න.**

..................................
..................................
..................................

06) **අයදුම්කරුගේ සහතිකය:**

මෙම අයදුම්පත්‍රයේ සපයා ඇති විස්තර සත්‍ය බවද නිවැරදි බවද මම මෙයින් සහාථ කරමි. මෙහි ඇතුලත් යම්කිසි විස්තරයක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ මා තෝරා ගැනීමට පෙර දැනගැනීමට ලැබුනහොත් ඒ හේතුවෙන් මා මෙම තනතුරට නුසුදුසු වීමටද, මෙම තනතුරට මා පත් කර ගැනීමෙන් පසුද එම වරද දැන ගැනීමට ලැබුනහොත් කිසිම වන්දි මුදලක් නොගෙවා මා සේවයෙන් පහ කරනු ලැබීමට ද යටත් වන බව දනිමි.

දිනය : .................. අයදුම්කරුගේ අත්සන: ..................

07) **අයදුම්කරුගේ අත්සන සහතික කිරීම:**

විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු.82,150/- කට වැඩි මූලික මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් හෝ සහතික කරනු ලැබ තිබිය යුතුය.

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ..................................
.. (සම්පූර්ණ නම) මහතා/මහත්මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත් ..........
..................දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේ තැබූ බවත් සහතික කරමි.

..................................
(අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන)

දිනය : ..................................

අත්සන සහතික කරන නිලධාරියාගේ නම : ..................................

තනතුර: ..................................

ලිපිනය: ..................................

(නිල මුද්‍රාවකින් සහාථ කළ යුතුය)

08) **ඉල්ලුම්කරු රාජ්‍ය සේවයේ නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය:**

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන..................................

(සම්පූර්ණ නම) මහතා / මහත්මිය / මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත් ..........
..................දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේ තැබූ බවත් සහතික කරමි.

ඔහුගේ/ඇයගේ වැඩ,පැමිණීම,හැසිරීම..................බවත්, ඔහු / ඇය වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති / සම්පූර්ණ කර නැති බවත්, ඔහු / ඇය මෙම තනතුර සඳහා සුදුසුකම් ලැබුවහොත් දැනට දරන තනතුරෙන් ඔහු/ ඇය මුදා හැරිය හැකි /නොහැකි බවත් සහතික කරමි.

..................................
(දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන)

දිනය : ..................................

නම : ..................................

තනතුර : ..................................
(නිල මුද්‍රාවකින් සහාථ කළ යුතුය)